# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

**දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk**


**මගේ අංකය :** එස්.එල්.පී.අයි.ඒ/බැහැර/237/19 **ඔබේ අංකය :**

2019.12.12

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
අතිගරු ජනාධිපති,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**අතිගරු ජනාධිපතිතුමා හමුවීම සඳහා වේලාවක් ලබා ගැනීම සම්බන්ධව.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති වශයෙන් ඔබතුමා තේරී පත්වීම සම්බන්ධව අප ඉතා සතුටට පත්වන අතර, ඔබතුමා වෙත ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ හෘදයාංගම සුභාශිංෂනය පිරිනමන්නට කැමැත්තෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය 1945 වර්ෂයේ ශ්‍රී ලංකා පොලිස් නියෝග ප්‍රකාරව ස්ථාපනය කරන ලද පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ අභිවෘද්ධිය සහ සුභසාධනය සඳහා පිහිටුවන ලද ස්වාධීන සංගමයක් වන අතර, ශ්‍රී ලංකා පොලිසියේ සේවයේ නියුතු පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් 10,000 ක් පමණ සාමාජිකත්වය ලබා සිටින ආයතනයකි.

පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන්ගේ දිගු කාලයක් පුරාවට නොවිසඳුණු ප්‍රශ්න බොහෝමයක් ඇති අතර, ඒ සම්බන්ධව ඔබතුමාගේ ද අවධානයට ලක්ව ඇති බව 2019 ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධව දක්වා ඇති පරිච්ඡේදයේද ඇතුලත් කිරීම තුලින් විද්‍යාමාන වේ. එබැවින් පහත කරුණු යටතේ ඔබතුමා සමග සාකච්ඡා කිරීම සඳහා අප සංගමයේ විධායක කමිටුව වෙත දිනයක් හා වේලාවක් ලබා දෙන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙමු.

- පොලිස් නිලධරයන්ගේ උසස්වීම් සම්බන්ධව.
- රජයේ නිල නිවාස.
- ගමන් වියදම් දීමනාව.
- ස්ථානමාරුවීම්.
- උපාධිධාරී පොලිස් නිලධරයන් සඳහා දිරි දීමනා ලබා දීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන්, පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නීතිඥවරුන් සම්බන්ධව.
- එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා යෙදවීම.
- ගර්භණී නිලධාරිණියන් හට පහසු සහ සුදුසු නිල ඇඳුමක් ලබාදීම.

- පොලිස් නිලධාරිණියන් දරු ප්‍රසූතියෙන් පසු මුහුණ දෙන රාජකාරීමය ගැටළු සම්බන්ධව.
- පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක වරුන් සඳහා රාජ්‍ය නිවේදිත නිල තත්ත්වය ලබා දීම.
- පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරීම.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

එස්. සංජය පෙරේරා,
පොලිස් පරීක්ෂක,
සභාපති,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

ගරු සභාපති
පොලිස් පරීක්ෂක සංගමය

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්.
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය